# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2055/8 – 2018 ජනවාරි 22 වැනි සඳුදා– 2018.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2017/208.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ශාඛාව, අංක.21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
02. රක්ෂණ සේවක සංගමය, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
03. අන්තර් සමාගම් සේවක සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ශාඛාව, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128, එස්. විරිතමුල්ල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2018 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2017/208.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ශාඛාව, අංක.21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
02. රක්ෂණ සේවක සංගමය, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
03. අන්තර් සමාගම් සේවක සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ශාඛාව, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ප්‍රවාහන දීමනාවක් ලබන විධායක නිලධාරීන් සඳහා රු.10,000/- ක අමතර ප්‍රවාහන දීමනාවක් ලබා දීමෙන් වැටුපෙන් 10 % ක ප්‍රවාහන දීමනාවක් ලබන විධායක නොවන ශ්‍රේණිවල සේවකයින් සඳහා අසාධාරණයක් සිදුවී තිබේද ? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේද ? යන්නත් පිලිබඳව වේ''.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

02 - 234

---

මගේ අංකය: IR/COM/05/P/2015/185.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. එම්. ආරියපාල මයා, රුවන් සෙවන, කැබැල්ලකැටිය, බිබිල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2018 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/P/2015/185.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. එම්. ආරියපාල මයා, රුවන් සෙවන, කැබැල්ලකැටිය, බිබිල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක. 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''දැනට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මහියංගන ඩිපෝවේ V වන ශ්‍රේණියේ නිලධාරියකු ලෙස සේවය කරන එච්. එම්. ආරියපාල මහතාගේ සේවය 2013.06.01 දින සිට ඔහුට විරුද්ධව සිදු කරනු ලැබූ විනය පරික්ෂනයේ විනය නියෝගය ක්‍රියාත්මක වන කාලය තෙක් වැටුප් රහිතව තහනම් කිරීමෙන් අහිමි වූ වේතනය හා අනෙකුත් දීමනා ඉල්ලා සිටීම යුක්තිසහගත වන්නේද යන්න සහ එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත්,

සහ

එම විනය පරීක්ෂණයේ විනය නියෝගය/අභියාචන නියෝගය පරිදි 2014.02.25 වැනි දින සිට අම්බලන්තොට ඩිපෝවට ස්ථාන මාරු කිරීම හා 2014.08.01 දින සිට 2015.01.31 දින දක්වා වේතන රහිතව සේවය අත්හිටුවීම මගින් අසාධාරණයක් සිදු වී ඇතැයි ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත වන්නේද යන්න සහ එසේ යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

02 – 235

---

මගේ අංකය: IR/COM/05/2017/155.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. වී. ඒකනායක මයා, පරගහහේන, පරදූව, අකුරැස්ස.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මාර්ග සංවර්ධන අධිකාරිය, මගනැගුම මහ මැදුර, කොස්වත්ත, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160, කේ.එම්. සරත්චන්ද්‍ර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2018 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2017/155.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එ. වී. ඒකනායක මයා, පරගහහේන, පරදූව, අකුරැස්ස.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මාර්ගය සංවර්ධන අධිකාරිය, මගනැගුම මහ මැඳුර, කොස්වත්ත, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

'' මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරයකු වන ඒ.වී.ඒකනායක මහතා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඒකාබද්ධ මාර්ග ආයෝජන ව්‍යාපෘතියේ ('1' මාර්ග ව්‍යාපෘතියේ) ව්‍යාපෘති ඉංජිනේරු ලෙස යොදවා එම ව්‍යාපෘතිය අවසන් වීමට පෙර කිසිදු හේතුවකින් තොරව එම ව්‍යාපෘතියෙන් මාරු කිරීමෙන් අසාධාරණයක් සිදුව තිබේද ? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද ? යන්න පිළිබඳව වේ.''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

02 – 236

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.